# විගණන සේවා කොමිෂන් සභාව

## කාර්ය සාධන වාර්තාව

## 2019.01.01-2019.03.31

විගණන සේවා කොමිෂන් සභාව

අංක 35 ඒ

ආචාර්ය එන්.එම්.පෙරේරා මාවත

කොළඹ 08

## දැක්ම

මහජන බැදියාව සහ වගවීම සඳහා කැප වූ

විශිෂ්ට විගණන සේවයක්

## මෙහෙවර

වෘත්තීයමයභාවය, නිපුණත්වය සහ යහපාලනය පෙරදැරි කර ගත් රාජ්‍ය විගණන සේවයක් ස්ථාපනය කිරීම තුළින් රාජ්‍ය සම්පත්වලට වගවීම සහතික කිරීම

## අපගේ අගයන්

- ස්වාධීනත්වය
- අපක්ෂපාතීත්වය
- අවංක භාවය
- නවෝත්පාදනය
- පාරදෘශ්‍යභාවය
- වගවීම
- වෘත්තීය නිපුණත්වය

# පෙලගැස්ම



| අනු අංකය | කාරණය | පිටුව |
|---|---|---|
| **1.** | හැඳින්වීම | **1** |
| **2.** | විගණන සේවා කොමිෂන් සභාවේ බලතල හා කාර්යයන් | **1-2** |
| 2.1 | ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 153 (ඇ) ව්‍යවස්ථාව මඟින් හා 2018 අංක 19 දරන ජාතික විගණන පනත අනුව පැවරී ඇති බලතල හා කාර්යයන් | **1-2** |
| **3.** | විගණන සේවා කොමිෂන් සභාවේ 2019.01.01 සිට 2019.03.31 දක්වා කාර්ය සාධනය | **2-3** |
| 3.1 | ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 153 ඇ ව්‍යවස්ථාවේ විධි විධාන හා 2018 අංක 19 දරන ජාතික විගණන පනත අනුව පැවරී ඇති බලතල හා කර්තව්‍යන්හි ප්‍රගතිය | 2 -3 |
| 3.2 | පරිපාලන හා මූල්‍ය ප්‍රගතිය | 3-4 |
| 3.3 | කොමිෂන් සභා රැස්වීම් | 5 |
| **4.** | කාර්ය මණ්ඩලය | **5** |
| 4.1 | කාර්ය මණ්ඩල පුහුණුව | 6 |
| **5.** | ඇමුණුම් | 7-8 |
| | 1. 2019.01.01 සිට 2019.03.31 දක්වා මූල්‍ය වාර්තාව | 7 |
| | 2. විගණන සේවා කොමිෂන් සභාවේ සංවිධාන සටහන | 8 |

# විගණන සේවා කොමිෂන් සභාව

## 1. හැඳින්වීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ XVII වන පරිච්ඡේදයේ 153 අ (1) ව්‍යවස්ථාව ප්‍රකාරව විගණන සේවා කොමිෂන් සභාව ස්ථාපිත කර ඇත.

## 2. කොමිෂන් සභාවේ බලතල හා කාර්යයන්

### 2.1. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 153 (ඈ) ව්‍යවස්ථාව මඟින් හා 2018 අංක 19 දරන ජාතික විගණන පනත අනුව පැවරී ඇති බලතල හා කාර්යයන්

I. ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවයට අයත් සාමාජිකයින්ගේ පත්කිරීම්, උසස් කිරීම්, මාරු කිරීම්, විනය පාලනය හා සේවයෙන් පහ කිරීමේ බලය.

II. අමාත්‍ය මණ්ඩලය විසින් විධිමත්ව කරනු ලබන ප්‍රතිපත්තිවලට යටත්ව ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවයට අයත් සාමාජිකයින්ගේ සේවයට බඳවා ගැනීමේ පටිපාටි, පත් කිරීම්, මාරු කිරීම්, විනය පාලනය හා සේවයෙන් පහකිරීම්වලට අදාළ රීති සකස් කිරීම.

III. නීතිය මඟින් ස්ථාපිත ජාතික විගණන සේවයේ වාර්ෂික ඇස්තමේන්තුව සකස් කිරීම.

IV. නීතිය මඟින් සලකනු ලබන පරිදි වූ වෙනත් බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම සහ ඉටු කිරීමේ බලය.

**V.** කාර්ය සාධන විගණන, පාරිසරික විගණන, තාක්ෂණික විගණන සහ වෙනත් යම් විශේෂ විගණන සඳහා ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවල කිසිදු විගණන ප්‍රමිතියක් නිශ්චිතව සඳහන් කර නොමැති අවස්ථාවකදී, එම විගණන සම්බන්ධයෙන් අදාළ විය යුතු බවට උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර සංවිධානය මගින් තීරණය කරන ලද ජාත්‍යන්තර ප්‍රමිතිවල ප්‍රතිපාදන, දේශීය අවශ්‍යතාවලට සරිලන පරිදි වූ සංශෝධන සහිතව අදාළ පරිදි සකස් කර ගැසට් පත්‍රයේ පළ කිරීම.

**VI.** විගණන කරනු ලබන ආයතනයක යම් ගනුදෙනුවක් යම් ලිඛිත නීතියකට පටහැනිව සිදු කර ඇති බවටත් එම ගනුදෙනුව මගින් වංචාවක්, නොසැලකිල්ලක්, සාවද්‍ය පරිහරණයක් හෝ දූෂණයක් හේතු කොටගෙන යම් ඌනතාවක් හෝ පාඩුවක්, දූෂණයක් සිදු වී ඇති බවටත්

විශ්වාස කිරීමට සාධාරණ හේතු කොමිෂන් සභාවට පවතින අවස්ථාවේ එම ඌනතාවලට හෝ පාඩුවට හෝ අදාළ වටිනාකම, විගණන සේවා කොමිෂන් සභාව විසින්, අධිභාරයක් පැනවීම සඳහා එම ගනුදෙනුව හේතු කොටගෙන සිදුවූ සෑම ඌනතාවකටම හෝ පාඩුවකටම අදාළ වටිනාකම් අදාළ ආයතනයේ ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා වෙත වාර්තා කිරීම.

**VII.** කොමිෂන් සභාවේ කටයුතුවලට සහය වීම සඳහා කමිටු පත් කිරීම.

**VIII.** ජාතික විගණන කාර්යාලයේ කාර්ය මණ්ඩලයේ කාර්ය සාධනයේ ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම සඳහා යෝජනා ක්‍රම හඳුන්වා දීම.

**IX.** පනතේ විධිවිධාන සලසා ඇති කරුණු සඳහා රීති සැකසීම.

X. රාජ්‍ය විගණන පුහුණු හා සංවර්ධන මධ්‍යස්ථානයේ කළමනාකරණයට අදාළ රීති සකස් කිරීම

## 3. විගණන සේවා කොමිෂන් සභාවේ කාර්ය සාධනය - 2019.01.01 සිට 2019.03.31

### 3.1 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 153 ඇ ව්‍යවස්ථාවේ විධි විධාන හා 2018 අංක 19 දරන ජාතික විගණන පනත අනුව පැවරී ඇති බලතල හා කාර්යයන්හි ප්‍රගතිය.

| බලතල | ප්‍රගතිය |
|---|---|
| ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවයට අයත් සාමාජිකයින්ගේ පත්කිරීම්, උසස් කිරීම්, මාරු කිරීම්, විනය පාලනය හා සේවයෙන් පහ කිරීම | I. පත්කිරීම් හා ඊට අනුෂාංගික කරුණු<br>➢ පත්වීම් ස්ථිර කිරීම් - 102<br>➢ සේවයෙන් මුදා හැරීම් - 71<br>➢ විශ්‍රාම ගැන්වීම් - 02<br>➢ ඉල්ලා අස්වීම් - 01<br><br>II. උසස් කිරීම්<br>➢ නියෝජ්‍ය විගණකාධිපති තනතුර සඳහා උසස් කිරීම් - 03 |


| | |
|---|---|
| ජාතික විගණන කාර්යාලයේ වාර්ෂික ඇස්තමේන්තුව සකස් කිරීම. | ➢ 2020 වාර්ෂික ඇස්තමේන්තුව සකස් කිරීමට අදාළ තොරතුරු විගණකාධිපතිගෙන් කැඳවීම |
| වෙනත්<br>1. ජාතික විගණන කාර්යාලය සඳහා ස්වාධීන විගණකවරයෙකු පත්කිරීම<br>2. විගණන නොවන කාර්ය මණ්ඩලවලට අදාළ කටයුතු (ජාතික විගණන කාර්යාලය) | ➢ පාර්ලිමේන්තු මහලේකම්ගේ ඉල්ලීමට අනුව ස්වාධීන විගණකවරයෙකු තෝරා ගැනීම සඳහා මිල ගණන් කැඳවීම<br>➢ සේවයේ ස්ථිර කිරීම - 02 |


### 3.2 පරිපාලන හා මූල්‍ය ප්‍රගතිය


2019 ජනවාරි සිට අප්‍රේල් දක්වා විගණන සේවා කොමිෂන් සභාව සඳහා පුනරාවර්තන වියදම් හා ප්‍රාග්ධන වියදම් ලෙස වෙන් කර ඇති ප්‍රතිපාදනවලින් 2019.01.01 සිට 2019.03.31 දක්වා වූ කාර්තුව සඳහා පුනරාවර්තන වියදම් ලෙස රුපියල් 8,280,783.34 ක් හා ප්‍රාග්ධන වියදම් ලෙස රුපියල් 75,000.00 ක් වැය කර ඇත.

**මූල්‍ය ප්‍රගති සාරාංශය - 2019.01.01 සිට 2019.03.31 දක්වා**

| | **ප්‍රතිපාදන (2019 ජනවාරි - අප්‍රේල් ඇස්තමේන්තුව අනුව) රු.** | **මුළු වියදම (2019.01.01-2019.03.31) රු.** | **ඉතිරිය (2019.03.31 දින වන විට) රු.** |
|---|---|---|---|
| පුනරාවර්තන | 16,620,000.00 | 8,280,783.34 | 8,339,216.66 |
| ප්‍රාග්ධන | 1,500,000.00 | 75,000.00 | 1,425,000.00 |
| **එකතුව** | **18,120,000.00** | **8,355,783.34** | **9,764,216.66** |




2019.01.01 සිට 2019.03.31 දක්වා වූ මූල්‍ය වාර්තාව ඇමුණුම 01 හි දක්වා ඇත.

### 3.3 කොමිෂන් සභා රැස්වීම්

2019.01.01 – 2018.03.31 දින දක්වා කාලය තුළ විගණන සේවා කොමිෂන් සභා රැස්වීම් වාර හතක් (07) පවත්වා ඇත.

## 4. කාර්ය මණ්ඩලය

විගණන සේවා කොමිෂන් සභාව සඳහා අනුමත කර ඇති මුළු තනතුරු සංඛ්‍යාව 43කි.

| විගණන සේවා කොමිෂන් සභාවේ අනුමත හා දැනට සේවයේ නියුතුකාර්ය මණ්ඩලය සහ පුරප්පාඩු පිළිබඳ තොරතුරු -2019.03.31 දිනට | | | | |
|---|---|---|---|---|
| තනතුරේ ස්වභාවය | තනතුර | අනුමත තනතුරු සංඛ්‍යාව | සේවයේ නියුතු සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
| ජ්‍යෙෂ්ඨ මට්ටම | ලේකම් | 10 | 03 | 07 |
| | අතිරේක ලේකම් | | | |
| | ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් | | | |
| | අධ්‍යක්ෂ | | | |
| | සහකාර ලේකම් | | | |
| | සහකාර අධ්‍යක්ෂ | | | |
| | අභ්‍යන්තර විගණක | | | |
| | ගණකාධිකාරි | | | |
| | නීති නිලධාරි | | | |
| තෘතීය මට්ටම | පරිපාලන නිලධාරි | 05 | 02 | 03 |
| | භාෂා පරිවර්තක | | | |
| | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරි | | | |
| ද්විතීය මට්ටම | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර | 16 | 10 | 06 |
| | රාජ්‍ය කළමනාකරණ සහකාර | | | |
| ප්‍රාථමික මට්ටම | රියදුරු | 12 | 9 | 03 |
| | කාර්යාල කාර්ය සහයක | | | |
| එකතුව | | **43** | **24** | **19** |

විගණන සේවා කොමිෂන් සභාවේ සංවිධාන සටහන ඇමුණුම 02 හි දක්වා ඇත.

## 10.1 කාර්ය මණ්ඩල පුහුණුව

විගණන සේවා කොමිෂන් සභා කාර්ය මණ්ඩලය පුහුණු කිරීම් වැඩසටහන් යටතේ 2019 පළමු කාර්තුව තුළ නිලධාරින් පහත දැක්වෙන පරිදි පුහුණු සඳහා යොමු කර ඇත.

| | පුහුණු වැඩසටහනේ නම | තනතුර | නිලධාරින් ගණන |
|---|---|---|---|
| 1 | රාජ්‍ය අංශයේ මුදල් රෙගුලාසි | රාජ්‍ය කළමනාකරණ සහකාර | 03 |
| 2 | පරිගණක දෘඩාංග හා පරිගණක නඩත්තුව | කාර්යාල කාර්ය සහායක | 02 |
| 3 | කාර්යාල ක්‍රම පිළිබඳ පුහුණු වැඩසටහන | පරිපාලන නිලධාරී<br>තොරතුරු තාක්ෂණ නිලධාරී<br>රාජ්‍ය කළමනාකරණ සහකාර | 12 |
| 4 | රාජ්‍ය ප්‍රසම්පාදන හා මිල කියුම්පත් ඇගයීම් | තොරතුරු තාක්ෂණ නිලධාරී | 01 |

ඇමුණුම 01

| විගණන සේවා කොමිෂන් සභාව<br>මුළු ප්‍රතිපාදන සහ වියදම 2019 -01 -01 දින සිට 2019-03-31 දින දක්වා | | | | | | |
|---|---|---|---|---|---|---|
| වැය විෂය | විස්තරය | ජන-අප්‍රේල් ප්‍රතිපාදන වෙන් කිරීම - 2019 රු. | අතිරේක ප්‍රතිපාදන වෙන් කිරීම - 2019 රු. | මු.රෙ. 66 මාරු කිරීම 2019 රු. | අනුමත මුළු ප්‍රතිපාදන වෙන් කිරීම - 2019 රු. | වියදම 2019-01-01 සිට 2019-03-31 දක්වා රු. |
| **23-01-01** | ***පුනරාවර්තන වියදම්*** | **16,620,000.00** | **-** | **-** | **-** | **8,280,783.34** |
| | **පුද්ගල පඩි නඩි** | **10,400,000.00** | | | | **4,890,301.79** |
| 1001 | වැටුප් හා වේතන | 5,000,000.00 | | | | 2,363,117.74 |
| 1002 | අතිකාල හා නිවාඩු දින වැටුප් | 400,000.00 | | | | 16,449.45 |
| 1003 | වෙනත් දීමනා | 5,000,000.00 | | | | 2,510,734.60 |
| | **ගමන් වියදම්** | **765,000.00** | | | | **-** |
| 1101 | දේශීය | 15,000.00 | | | | - |
| 1102 | විදේශීය | 750,000.00 | | | | - |
| | **සැපයුම්** | **700,000.00** | | | | **217,101.78** |
| 1201 | ලිපි ද්‍රව්‍ය හා කාර්යාලයීය වියදම් | 250,000.00 | | | | - |
| 1202 | ඉන්ධන සැපයීම් | 375,000.00 | | | | 154,888.00 |
| 1203 | ආහාර පාන හා නිල ඇඳුම් | 75,000.00 | | | | 62,213.78 |
| | **නඩත්තු වියදම්** | **175,000.00** | | | | **114,667.26** |
| 1301 | වාහන නඩත්තු වියදම් | 125,000.00 | | | | 86,474.20 |
| 1302 | යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ නඩත්තු වියදම් | 50,000.00 | | | | 28,193.06 |
| | **සේවා** | **4,430,000.00** | | | | **2,989,511.34** |
| 1401 | ප්‍රවාහන වියදම් | 575,000.00 | | | | 500,000.00 |
| 1402 | තැපැල් හා සංනිවේදන වියදම් | 425,000.00 | | | | 227,124.10 |
| 1403 | විදුලිය හා ජල වියදම් | 180,000.00 | | | | 83,957.00 |
| 1404 | බදු කුලී හා දේශීය බදු | 2,250,000.00 | | | | 1,636,363.65 |
| 1409 | වෙනත් වියදම් | 1,000,000.00 | | | | 542,066.59 |
| | **මාරු කිරීම්** | **150,000.00** | | | | **69,201.17** |
| 1505 | සම්මාදම් සහ දායක මුදල් | 25,000.00 | | | | - |
| 1506 | රජයේ සේවකයන් සඳහා දේපළ ණය පොලී | 125,000.00 | | | | 69,201.17 |
| **23-01-01** | ***ප්‍රාග්ධන වියදම්*** | **1,500,000.00** | **-** | **-** | **-** | **75,000.00** |
| | **මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම්** | **720,000.00** | | | | **-** |
| 2001 | ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 670,000.00 | | | | - |
| 2003 | වාහන | 50,000.00 | | | | - |
| | **මූලධන වත්කම් අත්පත් කර ගැනීම** | **620,000.00** | | | | **-** |
| 2102 | ගෘහ භාණ්ඩ හා කාර්යාලයීය උපකරණ | 620,000.00 | | | | - |
| | **මානව සම්පත් සංවර්ධනය** | **160,000.00** | | | | **75,000.00** |
| 2401 | කාර්ය මණ්ඩල පුහුණු | 160,000.00 | | | | 75,000.00 |
| | **මුළු එකතුව** | **18,120,000.00** | **-** | **-** | **-** | **8,355,783.34** |

ඇමුණුම 02

## විගණන සේවා කොමිෂන් සභාවේ සංවිධාන සටහන

